# ශාස්ත්‍රවේදී (ජනමාධ්‍ය) විශේෂවේදී උපාධිය ලබාගැනීම සඳහා සම්පූර්ණ කළ යුතු අවම විෂයය ඒකක

# (Minimum Yearly Load Fulfill Degree Requirement)

## ශ්‍රී පාලි මණ්ඩපය -ජනමාධ්‍ය අධ්‍යයන අංශය

| Year | Semester | Main Course-M | Elective Course- E | Foundation Course - F | Total Course Units | Credit |
|---|---|---|---|---|---|---|
| 1st | I | 06 | - | 01 | 07 | 21 |
| | II | 03 | 02 | 01 | 06 | 16 |
| 2nd | I | 05 | 02 | 01 | 08 | 22 |
| | II | 03 | 02 | - | 05 | 13 |
| 3rd | I | 02 | 02 | 01 | 05 | 13 |
| | II | 03 | 02 | 01 | 06 | 16 |
| 4th | I | 02 | 02 | 01 | 05 | 13 |
| | II | 02 | 02 | - | 04 | 10 |
| Total | | 26 | 14 | 06 | 46 | 124 |

ජනමාධ්‍ය අධ්‍යයන අංශයේ සිව් අවුරුදු උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීම සඳහා අදාළ වර්ෂවලදී සම්පූර්ණ කළ යුතු විෂය ඒකක ගණන ඉහත වගුවට අනුව තෝරා ගත යුතුය.

- සම්පූර්ණ කළ යුතු විෂය ඒකක ගණන - 46
- සම්පූර්ණ කළ යුතු සම්භාර (Credits) ගණන -124

පාඨමාලා සඳහා ලියාපදිංචිවීමේදී විෂය නිර්දේශයට අනුව ඔබ විසින් විෂය ඒකක තෝරා ගත යුතුය. ලියාපදිංචිවීම සඳහා ලබා දෙන කාල සීමාවෙන් පසුව විෂය ඒකක වෙනස් කරනු නොලැබේ.

**දෙවන වසරේ සිට ශාස්ත්‍රවේදී (ජනමාධ්‍ය) විශේෂ උපාධි පාඨමාලාව ක්ෂේත්‍ර 4ක් ඔස්සේ අධ්‍යයනය කිරීමට හැකි වනු ඇත. ඔබ තෝරා ගන්නා ප්‍රධාන විෂය ධාරාවට අනුව වෛකල්පිත (Elective) විෂයයන් තෝරා ගත යුත්තේ පහත සඳහන් ආකාරයටය.**

1. I) මාධ්‍ය අධ්‍යයන විෂය ක්ෂේත්‍රය අධ්‍යයනය කරන විද්‍යාර්ථීන් තමාට අදාළ සියලුම වෛකල්පිත (Elective) විෂය ඒකක මාධ්‍ය අධ්‍යයන විෂය ක්ෂේත්‍රයෙන්ම තෝරාගත හැකිය.

   II) රූපවාහිනී මාධ්‍ය අධ්‍යයනය ,ගුවන් විදුලි මාධ්‍ය අධ්‍යයනය සහ මුද්‍රිත මාධ්‍ය අධ්‍යයනය යන විෂය ධාරාවන්ගෙන් එකක් ප්‍රධාන ක්ෂේත්‍රය ලෙස හදාරන විද්‍යාර්ථීන් තමා හැදෑරිය යුතු අවම වෛකල්පිත (Elective) විෂයය ඒකක ප්‍රමාණය තමාගේ ප්‍රධාන විෂය ක්ෂේත්‍රයෙන් ආවරණය නොවන්නේ නම් එම වෛකල්පිත (Elective) විෂයය ඒකක ප්‍රමාණය සම්පූර්ණ කිරීමට මාධ්‍ය අධ්‍යයන විෂය ක්ෂේත්‍රයෙන් හෝ ප්‍රසංග කලා අධ්‍යයන අංශයේ වෛකල්පික විෂයයන් ඒ සඳහා තෝරාගත හැකිය.

   එසේ නැතහොත් /හෝ

   III) ඔබට අභිමත පරිදි වෛකල්පිත විෂයය තෝරා ගත හැකිය.

(2) මෙම සෑම පාඨමාලා ඒකකයටම අදාළ පරීක්ෂණ සඳහා පෙනී සිටීමට සෑම විද්‍යාර්ථියකුම 80% ක් දේශන සඳහා සහභාගී වී තිබිම අනිවාර්ය වේ.

(3) තම අධ්‍යයන අංශයෙන් බැහැර අධ්‍යයනාංශයකින් වෛකල්පිත විෂය ඒකක හදාරන්නට බලාපොරොත්තු වන විද්‍යාර්ථීන් ඒ සඳහා අධ්‍යයනාංශ දෙකෙහිම අංශාධිපතිවරුන්ගෙන් මේ සඳහා අනුමැතිය ලබාගත යුතුය.

(4) මෙම තෝරා ගැනීම් සම්බන්ධ අවශ්‍ය අවසාන තීරණය ජනමාධ්‍ය අධ්‍යයන අංශය සතුවන අතර තෝරා ගන්නා විෂය ධාරාවේ වෙනස්කම් නැවත සිදුකළ නොහැක.

(5) ඉහත සඳහන් කරුණු පිළිබඳව කිසියම් ගැටළුවක් වෙතොත් වැඩිදුර විස්තර දැනගැනීම සඳහා ජනමාධ්‍යය අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කළණි ඉරෝෂා ධර්මසිරි මිය (0773596228) විමසන්න

අංශාධිපති,
ආචාර්ය කුමුදිනි මද්දුමාගේ,
ජනමාධ්‍යය අධ්‍යයන අංශය,
ශ්‍රී පාලි මණ්ඩපය,